දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

# සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය
# SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි

**පළමුවන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
**(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)**

---

## I කොටස

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ) සොමි සිසිලෙහිදු ගහණොත රා සුරිඳු මෙන්
ලොහොකතට ලොහොකඬ මෙත් දවු වැලැඳි කල කුස රජ

අහෝ දිය රකුස් ගත හා වියෙමිනෙකෙණෙහි
පබවත බිය බොහෝ පත් සැපින් පහසොහු සැක පත්

පියුමසර වෙති යෙති දෙනො පුල් පියුම් විල්හි
මෙවැනියතට මෙ නොතන් වී හැඟැ කුසා බැව් දත්

(කව්සිළුමිණ, ඇම්.බී. ආරියපාල (සංස්)

(ආ) සමනොළ මුහුළ මහ සමුදුර මෙවුල් බර
සුලකළ පුවළ ලකඟන සිරි යොවුන් වර
තරකළ විසල් වාසල් යතුරු මෙ නුවර
බැඳැහළ රුවන් තනපට කියෙලියැ පවුර

සිසිවන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින
තිසි පුළුලුකුළ රිය සකයුරු තිසර තන
දිසි රන ලියෙව් රූ සිරි යුත් මෙ පුරඟන
ඇසි පිය හෙළන පමණින් නොවෙති දෙවඟන

(සැළලිහිණි සන්දේශය, සුචරිත ගම්ලත්, සංස්)

(ඇ) සුරසෙන් ගෙන සැදි සුදම් සබාවට
සතොසින් පැමිණෙන සුරිඳු සබාවට
අවසන් නොව දිලි රුවන් පබාවට
රජ සෙන් සහ රජ පිවිසි සබාවට

සරා ලකළ කිරුළ ග මිණි රැස් වැද
සරා උදය දිවුයුරු බිඹු සිරි ලද .
පුරා උදුල සේසත් සිහසුන් මැද
අරා පවර නරනිඳු වැඩ උන් සඳ

(ගුත්තිල කාව්‍යය, ඩබ්.එෆ්. ගුණවර්ධන, සංස්)

(ඇ) වතින් බතින් බුලතින් සියලු සැපතිනි
නිතින් විඳින පහසින් රසමුසු බසිනි
කතුන් සිත් ගනිමි යනු යමෙකකු කෙවැනි
දැලින් සුළං බඳනට තැත් කරන මෙනි

අම රසවන් අඹරස බුදිමින් සිනිඳු
නිති ගෙළයන් පෙදෙසෙහි සරමින් පසිඳු
එක පැහැයෙන් ඉඳිතත් කොවුලනට බඳු
නද පමණින් දැනගත හැකි රිටුන් ඉඳු

(සුභාෂිතය - සුචරිත ගම්ලත් සංස්)

(ලකුණු 28 යි)

## II කොටස

02. **කව්සිළුමිණ**, කුස - පබවත ප්‍රේමයේ අපූර්වත්වය විදහාපාන රසවත් මහා කාව්‍යයක් ලෙස අගය කළ හැකි දැයි, නියමිත සර්ග ඇසුරෙන්, පැහැදිලි කරන්න.

03. "**සැළලිහිණි** සන්දේශයෙහි එක් විශේෂත්වයක් වන්නේ අර්ථ ප්‍රකාශනයෙහි ධ්වනිපූර්ණ ගුණයයි." නිදසුන් මගින් මේ අදහස පහදන්න.

04. "**ගුත්තිල** කාව්‍යයෙහි ඇතුළත් වර්ණනා බොහෝමයක් මූලාශ්‍රය කථා වස්තුවෙන් වෙන් කළ නො හැකි පරිදි බැඳී පවතී." ඔබට අභිමත වර්ණනා දෙකක් ඇසුරෙන් කරුණු දක්වන්න.

05. "උපදේශය කාව්‍යෝක්තිය සමඟ මුසු කිරීම **සුභාෂිතයෙහි** පැනෙන එක් විශේෂත්වයකි." උදාහරණ සහිත ව විමසන්න.

## III කොටස

06. "පෙර පර වණන් නිසි විදිනි ගළපනු සඳ නම්
වණ ලොප් අදෙස් ඈ එහි ලැකියනුසරින් දන්නේ"
**සිදත් සඟරාවෙහි** සන්ධි විග්‍රහයට අනුව සන්ධි හා සන්ධි කාර්යයන් ගළපා ගන්නා අයුරු සනිදර්ශනව දක්වන්න.

07. "**සිදත්** කතුවරයාට අනුව, සිංහල භාෂා ව්‍යවහාරයෙහි ඇත්තේ පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග ද්විභේදය පමණකි." මේ මතය නූතන සිංහල ව්‍යවහාරයට නො ගැළපීම පිළිබඳ ඔබේ අදහස් සහේතුක ව දක්වන්න.

08. "නමින් පරව බෙදනු ලබනුයේ විබත් නම්"
විභක්ති යන ව්‍යාකරණාංගය භාෂාවේ අර්ථ ප්‍රකාශනය සඳහා ඉවහල් වන ආකාරය, විභක්ති ප්‍රභේද ඇසුරු කොට ගෙන සාකච්ඡා කරන්න.

09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් තුනකට ලුහුඬු විවරණ සපයන්න.
   - (i) ගතකුරු (ගාත්‍රාක්ෂර)
   - (ii) සස පියෙවි (ශබ්ද ප්‍රකෘති)
   - (iii) පෙර කිරිය හා මුසු කිරිය (පූර්වක්‍රියා හා මිශ්‍රක්‍රියා)
   - (iv) අන් අරුත් සමස (අන්‍යාර්ථ සමාසය)
   - (v) උපසර්ග

(02 - 09 ප්‍රශ්න වලට ලකුණු 18 බැගිනි)